**ලංකාපුර ප්‍රාදේශීය සභාව**

**පොළොන්නරුව දිස්ත්‍රික්කය**

**----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.

**-----------------**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 08 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2 මතය.**

-------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

-------------------------

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය සභාව විසින් නිරවුල් කළ යුතුව තිබුණු කර්මාන්ත ණයගැති හා ණයහිමි වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

(ආ) සභාව වෙත නීත්‍යානුකූලව අයකර ගැනීමට බලයක් නොතිබුණු වෙළඳ අයිතිය බදුදීමේ ආදායම් හිඟය රු. 456,134 ක්, ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කිරිම හේතුවෙන්, වර්ෂයේ ආදායම හා හිඟ ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ආදායම් රු. 94,175 ක්, මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඈ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ ණය වාරික ගෙවීම, ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යාක හා වෙනත් සේවා යටතේ පුනරාවර්තන වියදමක් වශයෙන් ගිණුම්ගත කිරිම හේතුවෙන්, පුනරාවර්තන වියදම් රු .122,117 ක් වැඩියෙන්ද ප්‍රාග්ධන වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ) පළාත් පාලන පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබුණු ෆෝටන් ඩ්‍රම් ට්‍රක් රථයේ වටිනාකම පිළිබඳ තොරතුරු ලබා නොදීම නිසා අදාල වත්කමේ වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා ගිණුම් පිළිවෙත අනුව, ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම හා ස්ථාවර වත්කම් අගය සමාන විය යුතු වුවත්, සාවද්‍ය ගිණුම්කරණ ගැළපීම් හේතුවෙන්, එම ගිණුම් දෙක අතර රු. 11,435,737 ක වෙනසක් ඇතිවී තිබුණි.

(උ) දැයට කිරුළ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකර සභාවට භාරදී ඇති පුලස්තිගම ජල ව්‍යාපෘතියේ වටිනාකම රු. 6,795,594 ක් සභා වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ඌ) පුලස්තිගම සති පොල භූමිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ආවරණ වෙළඳ කුටි වටිනාකම රු. 7,339,217 ක් ලෙස ලිපිගොනු අනුව අනාවරණය වුවත්, මූල්‍ය ප්‍රකාශන අනුව එහි වටිනාකම රු. 5,920,271 ක් ලෙස දැක්වීම නිසා, අදාල ගොඩනැගිල්ලේ වටිනාකම් රු. 1,418,946 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) පුලස්තිගම සතිපොල විවෘත වෙළඳ කුටි ඉදිකිරීමේ සත්‍ය වියදම රු. 6,966,529 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම රු. 5,635,654 ක් වූයෙන්, අදාල ගොඩනැගිල්ලේ වටිනාකම රු. 1,330,875 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) පුලස්තිගම සති පොල භූමිය කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීමේ වියදම රු. 1,995,050 ක්, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කරන ලද ඉකුත් වර්ෂයට අදාල ණයහිමි වටිනාකම සමාලෝචිත වර්ෂයට අදාල ණයහිමියන් ගිණුම්ගත කිරීමේදී, සමාලෝචිත වර්ෂයේ වියදම් සහ ණයහිමි වටිනාකම රු. 276,281 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සේවක ණය අත්තිකාරම් ශේෂය රු .49,392 ක් වූ අතර උපලේඛන අනුව රු. 114,201 ක් වූයෙන්, රු. 64,809 ක නොසැසඳිමක් නිරික්ෂණය විය.

1.3.2 ලැබිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු. 6,612,032 ක් විය. එයින් රු. 4,624,637 ක් හඳුනා ගෙන නොතිබුණි. එමෙන්ම අයකරගත හැකි උපයෝගී සේවා යටතේ දක්වා තිබුණු රු. 117,194 ක ශේෂය වර්ෂ 9 ක කාලයක සිටද, හිඟ මස්කඩ කුලී රු. 1,490,780 ක් 2003 වර්ෂයේ සිටද ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතින.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.39,579,880 ක් වූ ගණුදෙනු විගණයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 අනුකල නොවීම්

-------------------

පහත දැක්වෙන නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරික්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | |
| (i) | 152 (2) වගන්ති | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් වෘත්තියක් කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, සභාව විසින් එසේ පනවා අයකර ගැනීමට අමාත්‍යවරයා විසින් නිශ්චිතව සඳහන් කරන ලද නියෝගයක් මගින් නියම කළ මුදල නොඉක්මවන මුදලක්, බද්දක් සභාව විසින් අතුරු ව්‍යවස්ථා පනවා අයකරනු ලැබියහැකි වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 134 වගන්තිය | 2012 ඔක්තෝබර් 31 දිනැති අංක 1782/29 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව, ලංකාපුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තල්පොත නගරය දියුණු |

| | | |
|---|---|---|
| | | කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත්කර තිබුණ ද, වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/21 දරන උතුරුමැද පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අති විශේෂ ගැසට් නිවේදනය | සභාපතිවරයෙකු විසින් රාජකාරි ගමන් සඳහා මාසිකව දැරිය යුතු ඉන්ධන සීමාව ලීටර් 400 කට නොවැඩි වියයුතු නමුත් සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය තුලදී, එම ඉන්ධන සීමාව ඉක්මවා, වටිනාකම රු. 254,496 ක් වූ ඩීසල් ලීටර් 2132 ක් භාවිතා කර තිබුණි. |
| (ඇ) | පළාත් පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛ අංක 03<br>-------------------------------- | |
| (i) | 3.1 | සභාවට අයත් රජයේ ඉඩම් සහ ගොඩනැගිලි සඳහා හිමිකම් පත්‍ර ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. |
| (ii) | 6 හා 3.7 | සියළුම වත්කම් පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |

**02.** **මූල්‍ය සමාලෝචනය.**

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදමරු. 4,084,286 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු. 145,832 ක් විය.

2.2 ආදායම් පරිපාලනය.

----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 150 | 13 | 137 |
| (ii) බදු කුලී | 16,422 | 2,702 | 13,720 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,239 | 777 | 462 |
| (iv) වෙනත් ආදායම් | 37,588 | 17,350 | 20,237 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 1,686,650 ක්ද, මුද්දර ගාස්තු රු. 234,850 ක්ද විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කොන්ත්‍රාත් පාලනය

සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ පහත සඳහන් ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් වලට එළඹ තිබුණි.

| ව්‍යාපෘතිය | කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ දිනය | වැඩ නිමකර භාරදිය යුතු දිනය | ව්‍යාපෘති වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| රතනසාර පාසල් මාවත ඉදිකිරීම | 2014.09.03 | 2015.01.03 | 9,349,610 |
| සතිපොල බස් නැවතුම් පොල සුව පහසු මධ්‍යස්ථානය ඉදිකිරීම | 2014.09.17 | 2015.06.19 | 30,671,465 |

2015 ජුලි මාසය දක්වාම මෙම ව්‍යාපෘති නිමකර සභාව වෙත භාරදී නොතිබුණු අතර සුව පහසු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2015 ජුලි මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

3.2 අයවැය පාලනය

-------------------

සභාවේ අයවැයගත ආදායමේ හා තථ්‍ය ආදායමේ සියයට 36 සිට සියයට 91 ක් දක්වා විචලනයක් පැවති අතර, අයවැයගත වියදම හා තථ්‍ය වියදම අතර සියයට 43 සිට සියයට 90 දක්වා වූ විචලනයක්ද නිරූපණය වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය කළමනාකරණ මෙවලමක් වශයෙන් භාවිතා කර නොතිබුණු බව නිරික්ෂණය විය.

3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ විධිමත් කසල කළමනාකරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය සමඟ ඒකාබද්ධව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2012 නොවැම්බර් මාසයේදී සභාව වෙත රු. 1,099,511 ක අත්තිකාරම් මුදලක් සභාවට ලැබී තිබුණි. එහෙත් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ලබාදී ඇති ඉඩම සම්බන්ධව ප්‍රජාවගේ විරෝධතාවයක් ඇතිවීම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු 2015 ජූලි මාසය වන විටත් ආරම්භ කර නොතිබුණි.

3.4 අභ්‍යන්තර විගණනය

-----------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයන්හි සභාව තුළ අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණු අතර පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින්ද ප්‍රමාණවත් විගණනයක් සභාව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය